#mediaethicsSL #SinhalaPress #lka #Divaina

"සිසේරියන් සැත්කම්වලින් පසු- තව්හීද් ජමාත් දොස්තර සිංහල බෞද්ධ මවුවරුන් හාරදහසක් වඳ කරලා" යන මැයින් යුතුව දිවයින මුල් පිටුවේ ප්‍රධාන සිරස්තල පුවත ලෙසින් පලවූ ප්‍රවෘත්තිය පාඨකයින් අතර විශාල බලපෑමක් ඇතිකරන්නට සමර්ථ වූ අතර, සමාජ මාධ්‍ය ජාල තුළද මෙය බොහෝ සෙයින් විවාදයට පාත්‍ර වී ඇත. මෙම ප්‍රවෘත්තිය වෙනත් පුවත්පත් තුළ ප්‍රථමයෙන් පළ නොවූ අතර, දිවයින ප්‍රවෘත්තිය එළිදැක්මෙන් පසු ඒ සම්බන්ධ පසුවිපරම් පුවත් ලෙසින් තවත් මාධ්‍ය තුළ දක්නට ලැබිණි.

දිවයින පුවත සම්බන්ධයෙන් නිරීක්ෂණය කළ හැකි කාරණා කිහිපයකි.

මෙම ප්‍රවෘත්තියට පදනම් වූ හඳුනාගත හැකි මූලාශ්‍රයන් සඳහන් වී නොමැත. ජනමාධ්‍යවේදීන් තම මූලාශ්‍රයන්ගේ රහස්‍ය භාවට රැකීම ඇවැසි විට මූලාශ්‍රයන් සඳහන් නොකිරීම පිළිගත හැකි නමුත්, එය විශේෂයක් මිස සාමාන්‍ය භාවිතය විය යුතු නොවේ. එසේම පොලිසිය මූලාශ්‍රය ලෙසින් මෙහි සඳහන් වන්නේද ප්‍රවෘත්තියේ මැද ඡේදයක මිස ආරම්භයේදී නොවන බවද නිරීක්ෂණය කළ හැක. අද දෙරණ සහ අරුණ වාර්තා කරන අන්දමට කථානායක කරු ජයසූරිය විසින් ප්‍රකාශ කොට ඇත්තේ තමන් පුවත පළවූ දින උදෑසන පොලීසියෙන් සහ බුද්ධි අංශ නිලධාරීන්ගෙන් මේ පිළිබඳව කළ විමසීමකදී එවැනි සිදුවීමක් පිළිබඳ වාර්තා නොවූ බව ඔවුන් පැවසූ බවටයි. කෙසේ වෙතත් මෙම දිවයින පුවතේ සඳහන් කරුණ සම්බන්ධයෙන් විශේෂ සොයාබැලීමක් කෙරෙන බවද වැඩිදුරටත් කථානායකවරයා සඳහන් කොට ඇත.

මෙවැනි පුවතක් පළ කිරීමේදී එය මනා මධ්‍යස්ථභාවයකින් යුතුව පළ කිරීමත්, පාඨකයින්ට සිහිනුවණින් යුතුව එම පුවත සම්බන්ධයෙන් තීරණය කළ හැකි පරිද්දෙන් කරුණු කාරණා සහිත තොරතුරු ඉදිරිපත් කිරීමත් ජනමාධ්‍යයකින් බලාපොරොත්තු වන ආචාර ධාර්මික හැසිරීමයි. එය වඩාත් වැදගත් වන්නේ වර්තමානයේ රටේ තත්වයද සලකා බලන විටදීයි. මෙම දිවයින පුවත ඔස්සේ එය ඉටුවී තිබේන්නේද නැතිද යන වගද පාඨකයින් විසින් නිර්ණය කළ යුතු වෙයි.

මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?